*සැ. යු.*- 2024.03.07 දින පළකරන ලද අංක 2375 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,376 - 2024 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2024.03.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 62 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 64 |

*සැ. යු.*- කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත, 2024 මාර්තු මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදි.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 අප්‍රේල් 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

61 - B 082549 — 353 (2024/03)
D 1 -

# පිස්කල් විකිණීම්

## කොළඹ දිසා අධිකරණයේ දී ය

### පිස්කල් විකිණීමයි

කොළඹ 03, ගාලු පාරේ, අංක 450, දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති මාලඹේ, අතුරුගිරිය පාර, අංක 410/2 දරන ස්ථානයේ ''මාලඹේ ශාඛා'' කාර්යාලය පිහිටා ඇති පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (Pan Asia Banking Corporation PLC)

නඩු අංකය : DMB/00125/16
වටිනාකම : රු. 4,482,938.64
ස්වභාවය : උකස්
කාර්යපටිපාටිය : සාමාන්‍ය

......................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. ඩී. එන්. ජී. ඇක්සසරීස් ලංකා පුද්ගලික සමාගම, D.N. G. Accessories Lanka (Private) Limited, අංක 479, බුලර්ස් පාර, කොළඹ 08.

*සහ*

අංක 7/1, චාර්මන්ට් පාර, කොළඹ 06.

2. කුනන්ගේ ගයාචන්ද්‍ර විජේරුවන්, අංක 3/49, විල්මට් ඒ. පෙරේරා මාවත, හොරණ,

..........................*විත්තිකරුවන්.*

වර්ෂ 2019 ක් වූ ජූලි මස 11 වැනි දින දී කොළඹ දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව එකී පැමිණිලිකරුට ඉහත විත්තිකරුගෙන් අයකර ගැනීමට ඇති ණය පහසුකම මත රුපියල් හතලිස් හතර ලක්ෂ අසූ දෙදහස් නව සිය තිස් අටයි ශත හැට හතර (රු.4,482,938.64) ක් වූ ඉහත සඳහන් මුදල සහ රු. 4,410,633.19 ක මුදල මත වර්ෂ 2016.01.26 වැනි දින සිට වර්ෂයකට 24% බැගින් වූ පොලියක් ද පැමිණිලිකරුට ගෙවන ලෙස ද,

රුපියල් හතලිස් හතර ලක්ෂ අසූ දෙදහස් නව සිය තිස් අටයි ශත හැට හතර (රු. 4,482,938.64) ක් වූ ඉහත සඳහන් මුදල සහ රු. 4,410,633.19 ක මුදල මත වර්ෂ 2016.01.26 වැනි දින සිට වර්ෂයකට 24% බැගින් වූ පොලියක් ද අයකර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද අංක 75 දරන උකස්කරයෙහි උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2024 අප්‍රේල් මස 30 වැනි දින පස්වරු 1.00 ට,**

මා විසින් තහනමට ගන්නා ලද වැවල 615 ඊ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වැවල ග්‍රාමයේ පිහිටි ''මොරගහලන්ද'' නමින් හඳුන්වන මෙහි උපලේඛනයේ විස්තර කර ඇති නිශ්චල දේපළ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, හොරණ නගර සභා සීමාව ඇතුළත, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැවල 615 ඊ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැවල ග්‍රාමයේ පිහිටි මොරගහලන්ද'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. විතාරනගේ විසින් මැන සාදන ලද වර්ෂ 2009.08.23 වැනි දිනැති අංක 4280 දරන පිඹුරේ (බලයලත් මානක වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1996.08.22 දිනැති අංක 3440 බී පිඹුරේ ලොට් 2 දරන කොටස නැවත මැන සකසන ලදී) ලොට් 2 වශයෙන් නිරූපිත බෙදා වෙන් කර දක්වා ඇති ඉඩමට මායිම් උතුරට : වැවල සිට මුණගම දක්වා ඇති ප්‍රධාන පාර ද, නැගෙනහිරට : අංක 3440බී දරන පිඹුරේ මෙම ඉඩමේ ම ලොට් 3 ද, දකුණට : අංක 3440 බී දරන පිඹුරේ මෙම ඉඩමේ ම ලොට් ආර් 1 (පාරක් සඳහා වෙන් කළ) ද, සහ බස්නාහිරට : අංක 3440 බී දරන

පිඹුරේ මෙම ඉඩමේ ම ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම පහ (පර්. 20.5) ක් වන බිම් ප්‍රමාණය සහ ඒ මත පිහිටි විල්මට් පෙරේරා මාවත, වරිපනම් අංක 49/2 දරන ගොඩනැගිල්ලක් සහ ගහකොළ වැවිලි ආදී සෑම සියලු දේද වේ.

මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුමේ/පත්ඉරු A157/108 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් 2 දරන ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩම නැවත මැන සාදන ලද්දකි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, හොරණ නගර සභා සීමාව ඇතුළත, වැවල ග්‍රාමයේ පිහිටි ''මොරගහලන්ද'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1996.08.22 දිනැති අංක 3440 බී පිඹුරේ ලොට් 2 වශයෙන් බෙදා වෙන් කර දක්වා ඇති ඉඩමට මායිම් උතුරට : වැවල සිට මූණගම දක්වා ඇති ප්‍රධාන පාර ද, නැගෙනහිරට : මෙම පිඹුරේම ලොට් 3 ද, දකුණට : ලොට් ආර් 1 (පාරක් සඳහා වෙන් කළ) ද, සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම පහ (පර්. 20.5) ක් වන බිම් ප්‍රමාණය සහ ඒ මත පිහිටි විල්මට් පෙරේරා මාවත, වරිපනම් අංක 49/2 දරන ගොඩනැගිල්ල සහ ගහකොළ වැවිලි ආදී සෑම සියලු දේද වේ.

මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුමේ/පත්ඉරු C 309/116 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් කොටස් මතින් සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතිවාසිකම් සමඟ ද වේ.

1. ඉහත කී වැවල ග්‍රාමයේ පිහිටි ''මොරගහලන්ද'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1996.08.22 දිනැති අංක 3440 බී පිඹුරේ ලොට් ආර් 1 වශයෙන් ලකුණු කර බෙදා වෙන් කර දක්වා ඇති ඉඩමට මායිම් උතුරට : ලොට් 2 සිට 4 දක්වා ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 6 සිට 9 දක්වා ද, සහ බස්නාහිරට : ලොට් 1 ද යන මායිම් තුල පිහිටි ඉහත කී පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහසයයි දශම දෙක (රූ, 2, පර්. 16.2) ක් වන බිම් ප්‍රමාණය වන අතර මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 99/326 හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී වැවල ග්‍රාමයේ පිහිටි ''මොරගහලන්ද'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ" එල්. සේනාරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1996.08.22 දිනැති අංක 3440 බී පිඹුරේ ලොට් ආර් 2 (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් ලකුණු කර බෙදා වෙන් කර දක්වා ඇති ඉඩමට මායිම් උතුරට : ලොට් ආර් 1 ද, නැගෙනහිරට : ලොට් 8 ද දකුණට : ලොට් ආර් 3 ද සහ බස්නාහිරට : ලොට් 9 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම දෙක (පර්. 6.2) ක් වන බිම් ප්‍රමාණයවන අතර මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 99/327 හි ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී වැවල ග්‍රාමයේ පිහිටි ''මොරගහලන්ද'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1996.08.22 දිනැති අංක 3440 බී පිඹුරේ ලොට් ආර් 3 (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් ලකුණු කර බෙදා වෙන් කර දක්වා ඇති ඉඩමට මායිම් උතුරට : ලොට් 6 සිට ලොට් 9 දක්වා, ලොට් ආර් 2 සහ අංක 4955 පිඹුරේ ලොට් 2 ද, නැගෙනහිරට : 4955 පිඹුරේ ලොට් 2 ද, දකුණට : ලොට් 13, ආර් 4, ලොට් 12, ආර් 7, ලොට් 11, ලොට් 10 සහ ආර් 9 ද සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම අට (පර්. 23.8) ක් වන බිම් ප්‍රමාණයවන අතර මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 113/263 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - හොරණ.

වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 21 වැනි දින දී ය.

03-303

# විවිධ දැන්වීම්

## කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ දී ය.

**(සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන)**

නඩු අංකය : CHC/14/2024/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම (සමාගම්)

මාතලේ, වරකාමුර, වරකන්ද වත්ත, අංක 07 දරන ලිපිනයෙහි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති මාම් බිස්කට්ස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම PV95313 අධිකරණය මගින් 2007 අංක 07 දරන සමාගම් (සංශෝධිත) පනතෙහි 270 වන වගන්තියෙහි නියමයන් යටතේ සහ ප්‍රකාරව ගණන් බේරා වසා දැමීම සඳහා කරනු ලබන ඉල්ලීමයි.

මැන්චෙස්ටර් ෆුඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
අංක 179/1, වත්තේගම පාර, උකුවෙල.

*..................පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම, කොළඹ වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් එම අධිකරණය වෙත **වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 15 වැනි දින දී** උකුවෙල, වත්තේගම, අංක 179/1 දරන ස්ථානයේ මැන්චෙස්ටර් ෆුඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් පිළිගන්වන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ. තවද එකී පෙත්සම අධිකරණය ඉදිරියේ **වර්ෂ 2024 ක් වූ මැයි මස 10 වැනි දින** විභාග කිරීමට නියමකර ඇති බවත් එකී පෙත්සම සම්බන්ධයෙන් ආඥාවක් කිරීමට ආධාර කිරීමට හෝ විරුද්ධවීමට කැමති ඒ සමාගමේ යම් ණයහිමියෙකු හෝ ආධාරකරුවෙකුට විභාග කරන අවස්ථාවේ දී පෞද්ගලිකවම හෝ තම නීති උපදේශක හෝ නීතිඥවරයා මාර්ගයෙන් ඒ සඳහා පෙනී සිටිය හැකි බවත් පෙත්සමේ පිටපතක් එය ඉල්ලා සිටින එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ ආධාරකරුවෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවීම මත පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කලේ,*

නීතිඥ තුෂාරා සමන්පාලි අමරසිරි,
අංක 58/2B, 3 වන පටුමග,
සෝමා තලගල මාවත,
ගංගොඩවිල, නුගේගොඩ.

***සැළකිය යුතුයි.***- ඒ පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පැමිණ සිටීමට අදහස් කරන යම් තැනැත්තෙකු ඉහත නම් සඳහන් නීතිඥ තුෂාරා සමන්පාලි අමරසිරි වෙත එසේ පැමිණීමේ තම අදහස පිළිබඳ ලිඛිත දැන්වීමක් භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතුයි. දැන්වීමෙහි ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය හෝ ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ප්‍රකාශ කරනු ලැබූ ඒ පුද්ගලයාගේ හෝ ව්‍යාපාර ආයතනයේ අත්සන හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයා (ඇතොත්) නීතිඥවරයාගේ අත්සන තිබිය යුතු අතර එය භාරදීම හෝ තැපැල් කරන්නේ නම් **වර්ෂ 2024 ක් වූ මැයි මස 09 වැනි දින සවස 6 ට** පෙර ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ එවිය යුතු ය.

පෙත්සම්කරුගේ නීතිඥ,

නීතිඥ තුෂාරා සමන්පාලි අමරසිරි,
අංක 58/2B, 3 වන පටුමග,
සෝමා තලගල මාවත, ගංගොඩවිල, නුගේගොඩ.

වර්ෂ 2024 ක් වූ මාර්තු මස 06 වැනි දින දී ය.

03-270

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය.**

කොළඹ 02, කිව් පාර, අංක 199 දරන ලිපිනයේ ක්‍රොප්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (Cropwiz (Private) Limited) පිළිබඳ කාරණාව සම්බන්ධවයි.

*..............ගණන් බේරා වසා දැමීමට අපේක්ෂා කරන සමාගම.*

නඩු අංකය : Hc/civil/16/2024/co
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
කාර්ය පටිපාටිය : ලඝු
වටිනාකම : රු. 38,545,548.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන කොටස යටතේ ගරු අධිකරණය විසින් සමාගම ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණාව සම්බන්ධවයි.

කොළඹ 02, කිව් පාර, අංක 199 දරන ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලේ 03 වන මහලේ සී. අයි. සී. ඇග්‍රී බිස්නසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, (C.I.C. Agri Businesses (Private) Limited)

*......................පෙත්සම්කරු.*

බස්නාහිර පළාත්බද කොළඹ දී පවත්වන මහාධිකරණය (සිවිල් මහාධිකරණය) විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 02, කිව් පාර, අංක 199 දරන ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලේ, 03 වන මහලේ සී. අයි. සී. ඇග්‍රී බිස්නසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (C.I.C. Agri Businesses (Private) Limited) විසින් **2024 ක් වූ පෙබරවාරි මස 22 වැනි දින** එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම **2024 ක් වූ මාර්තු මස 28 වැනි දින** අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණයහිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ :*

පෝල් රත්නායක ඇසෝසියේට්ස්,
නීතිඥවරු,
අංක 59, ග්‍රෙගරි පාර,
කොළඹ 07.

*සටහන.-* එකී පෙත්සම සම්බන්ධව විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු, එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥවරුන්වන පෝල් රත්නායක ඇසෝසියේට්ස් සමාගමට 1939 සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීතිවල දක්වා ඇති අංක 9 ආකෘතියට අනුකූලව සැකසූ ලිඛිත දැන්වීමක් බාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම, හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය, ණය හිමියෙකු නම් අයවිය යුතු ණය මුදල ද, දායකයෙකු නම් තමන්ට හිමි සමාගමේ කොටස් සංඛ්‍යාව ද, දැන්වීමේ ප්‍රකාශ කළයුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයෙක් සිටී නම් නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, **වර්ෂ 2024 ක් වූ මාර්තු මස 27 වන දින පස්වරු 6.00** ට පෙර බාරදිය යුතුය. *නැතහොත්* තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලයක් තුළ, (ඉහත නම සඳහන් නීතිඥවරුන්) ඔවුන්ට ලැබෙන ලෙස තැපැල් මගින් එවිය යුතුය.

පෝල් රත්නායක ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥවරුන්.

03-339

## පාර්ලිමේන්තුව

### මහාචාර්ය ආශු මාරසිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

නීතිඥ ප්‍රේම්නාත් සී. දෙලවත්ත වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ "මහාචාර්ය ආශු මාරසිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* ආබාධ සහිත තැනැත්තන්, දිළිඳු තැනැත්තන් ඇතුලු සමාජයෙන් කොන් වී සිටින පිරිස් සහ කාන්තාවන් හා ළමයින් ස්වකීය හැකියාවන් මුදුන්පත් කරගැනීම සඳහා බලවත් කිරීම ;

*(ආ)* අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික, සෞන්දර්ය සහ ක්‍රීඩා පහසුකම් සංවර්ධනය කිරීම සහ විවිධ උත්සව සහ තරග සංවිධානය කිරීම ; සහ

*(ඇ)* ආර්ථික අපහසුතා ඇති පවුල්වල ළමයින්ගේ පාසල් මට්ටමේ සිට විශ්වවිද්‍යාලය දක්වා අධ්‍යාපන කටයුතුවලට ආධාර දීම;

යනාදිය වේ.

නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

03-268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.